**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව**

**-----------------------------------**

## 1.1 තත්ත්වාගණය කළ මතය

ශ්‍රී ලංකා රේගුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා රේගුව විසින් නියමිත දිනයට පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**<br>2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය දින 19 ක ප්‍රමාදයකින් පසු 2019 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වාර්ෂිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රේගු දෙපාර්තමේන්තුව 2017 වර්ෂය දක්වා අය ශීර්ෂ 641 යටතේ ආදායම් සඳහා වන විසර්ජන ගිණුමද, 247 වැය ශීර්ෂය යටතේ වෙනම විසර්ජන ගිණුමක්ද වශයෙන් අවසන් ගිණුම් දෙකක් ඉදිරිපත් කරන ලදී. එහෙත් 2018 වසරේදී අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව මූල්‍ය ප්‍රකාශන වශයෙන් ඉහත ගිණුම් දෙකම එකම ආකෘතියක ඉදිරිපත් කිරීමට සිදු විය. එහෙත් භාණ්ඩාගාරයේ පවතින අග්‍රිම ගිණුම සෘජුවම 247 වැය ශීර්ෂය යටතේ එයට අදාල ගණුදෙනු පමණක් අග්‍රිම ගිණුම තුල පෙන්නුම් කරයි.<br><br>ඒ අනුව මෙම ශීර්ෂ දෙක එකවර ගලපා ගැනීම සඳහා යම් කාල පමාවක් (පූර්වාදර්ශයක් නොතිබූ බැවින්) අවශ්‍ය වූ බැවින් හා භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමට සිදු වූ නිසාත් ඉහත ප්‍රමාදය සිදුවිය. ඉදිරියේදී මෙම ප්‍රමාදය සිදු නොවීමට වග බලා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |

**1.6.2 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී 2017 වර්ෂයට අදාල තොරතුරු නියමිත | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2017 වර්ෂයේදී පිළියෙල කර නොතිබූ බැවින් එම තොරතුරු 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල ආකෘති පත්‍රයට ඇතුළත් කිරීමට නොහැකි වූ බව |

| | | |
|---|---|---|
| ආකෘතීන් තුළ ඇතුළත් කර නොතිබුණි. | | කාරුණිකව දන්වමි. |

### 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අංක 20.03.03.01 (දඩ මුදල් හා රාජසන්තක කිරීම) දරන ආදායම් සංකේතය යටතේ රැස්කළ ආදායම වූ රු.420,073,711 ක් ආපසු ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ආදායම් ප්‍රකාශයෙහි (ඒසීඒ - 1) එම වටිනාකම වැරදි නිවැරදි කිරීමක් ලෙස දක්වා තිබුණි. | ආදායම හඳුනාගැනීම, ආපසු ගෙවීම් වාර්තා කිරීමේදී නිවැරදි තත්ත්වය අනාවරණය කිරීමට කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණ නිවැරදිය. රු.420,073,711 නිරූපණය වන්නේ ආපසු ගෙවීම සඳහා හරස් සටහන් මගින් පොදු තැන්පත් ගිණුමට මාරු කරන ලද දඩ හා රාජසන්තක කිරීම්වල වටිනාකමය. එය තැන්පත් ගිණුම හරහා මුදලින් ගෙවා ඇත. ඉදිරි වර්ෂයේදී මෙය ආකෘතියේ නිවැරදි ආකාරයෙන් සටහන් කිරීමට සටහන් කර ගතිමි. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයට අදාලව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කර තිබූ රු.2,165,216,031 ක වටිනාකම තුළ වැය ශීර්ෂ මගින් පියවන ලද රු.5,064,750 ක වටිනාකම ද ඇතුළත් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් හා මුදල් සමාන දෑ වලින් සිදු කරන ගනුදෙනු පමණක් ඇතුළත් කළ යුතු වීම. | ගිණුම් සාරාංශ මගින් ලැබීම් ලෙස සඳහන් රු.5,064,750 ක මුදල රේගු බදු ආදායම් යටතේ ඇතුලත් කර ඇති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් මිලදී ගැනීම හෝ ඉදිකිරීම් යටතේ වන රු.109,972,279 තුළ මුදල් යෙදවීමක් ලෙසද ඇතුලත් කර ඇත. |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 මූල්‍ය ප්‍රකාශනවල සටහන (VII) හි අස්ථානගත වවුචර් කිසිවක් නොමැති බව වාර්තා කර තිබුණද, එකතුව රු.225,904,874 ක වටිනාකමකින් යුතු ගෙවීම් වවුචර්පත් 29 ක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | (i) ගිණුම් වර්ෂයට අදාළ සියලුම ගෙවීම් වවුචර් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට පෙර විගණනය වෙත ඉදිරිපත් කිරීම.<br>(ii) වවුචර් අස්ථානගත වී ඇතිනම් මුදල් රෙගුලාසි 272(1) ප්‍රකාරව කටයුතු කිරීම හා 1993 ජුලි 21 දිනැති අංක 320 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. | 2018 මූල්‍ය ප්‍රකාශණවල සටහන (vii) හි සඳහන් පරිදි අස්ථානගත වවුචර් කිසිවක් නොමැත යන්න නිවැරදි වේ. වෙක්පත් නිකුත් කිරීමේ දී ප්‍රමාදයන් සිදු වන බැවින් අදාල වවුචර් ඔබ වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇති නමුත් එම වවුචර් 103 න් 74 ක් 2019 මැයි 29 දින ඔබ වෙත ඉදිරිපත් කර ඇති අතර ඉතිරිය නොපමාව ඔබ වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

**1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු විය. එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන පනතේ විධිවිධාන අධ්‍යයනය කර ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

ඉදිරිපත් කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 1.6.1 හා 3.2 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | රේගු දෙපාර්තමේන්තුව 2017 වර්ෂය දක්වා අය ශීර්ෂ 641 යටතේ ආදායම් සඳහා වන විසර්ජන ගිණුමද, 247 වැය ශීර්ෂය යටතේ වෙනම විසර්ජන ගිණුමක්ද වශයෙන් අවසන් ගිණුම් දෙකක් ඉදිරිපත් කරන ලදී. එහෙත් 2018 වසරේදී අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව මූල්‍ය ප්‍රකාශන වශයෙන් ඉහත ගිණුම් දෙකම එකම ආකෘතියක ඉදිරිපත් කිරීමට සිදු විය. එහෙත් භාණ්ඩාගාරයේ පවතින අග්‍රිම ගිණුම සෘජුවම 247 වැය ශීර්ෂය යටතේ එයට අදාල ගණුදෙනු පමණක් අග්‍රිම ගිණුම තුල පෙන්නුම් කරයි.<br><br>ඒ අනුව මෙම ශීර්ෂ දෙක එකවර ගලපා ගැනීම සඳහා යම් කාල පමාවක් (පූර්වාදර්ශයක් නොතිබූ බැවින්) අවශ්‍ය වූ බැවින් හා භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමට සිදු වූ නිසාත් ඉහත ප්‍රමාදය සිදුවිය. ඉදිරියේදී මෙම ප්‍රමාදය සිදු නොවීමට වග බලා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| **(i)** වාවස්ථාපිත විධිවිධාන<br>1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) ආ වගන්තිය | **16,007,590,727** | තෑග අරමුදලින් තෑග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු තෑග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබී ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වසරේ සිට 2018 වර්ෂය දක්වා වූ වර්ෂ 20 ක් තුළ රු.16,007,590,727 ක තෑග මුදල් ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තු නියෝගය සඳහා විධිමත් පරිදි මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබී ඇති බවට තහවුරු කර ගැනීම. | තෑග මුදල් ගෙවීම සම්බන්ධව 1869 අංක 17 දරණ රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තියට අනුව ඔබගේ නිරීක්ෂණය සමග එකඟ නොවෙමි. 1988 වර්ෂයේ අංක 118 දරණ දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කිරීමේදී අවශ්‍ය අනුමැතිය ලබාගෙන එය නිකුත් කර ඇතැයි යන්න උපකල්පනය කළහැකි අතර, තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතුවේ. |
| **(ii)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රි | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ක සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය ----------- | | | | |
| ▪ XII පරිච්ඡේදයේ 1:2 වගන්තිය | - | ශ්‍රී ලංකා රේගුවේ ඇතැම් නිලධාරීන් නිවාඩු ලබා ගැනීමේදී පොදු 125 ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර ඉදිරිපත් කර නොතිබුණු අතර පොදු 190 නිවාඩු ලේඛනයෙහි නිවාඩු ඇතුලත් කර අධීක්ෂණ නිලධාරියා විසින් සහතික කර නොතිබුණු අවස්ථා විය. | පොදු 125 ආකෘතිය මගින් නිවාඩු ලබා ගැනීමට පෙර නිවාඩු අනුමත කරවා ගත යුතුය. | විගණන නිරීක්ෂණය නිවැරදිය. මේ වන විට අදාල පරිදි නිවාඩු අනුමත කර නිවාඩු ලබා ගැනීම සිදු කරනු ලැබේ. |
| ▪ XXIV පරිච්ඡේදයේ 04 ඡේදය | 3,997,823 | (i) විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව නියමිත කාලවකවානු තුළ ණය මුදල් නිරවුල් කිරීම. | විගණන නිරීක්ෂණ නිවැරදිය. 2018 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන්ගෙන් අය විය යුතුව තිබූ රු.3,997,823 ක ණය ශේෂයන්ගෙන් 2018 මැයි 28 දින වන විට රු.1,027,715 ක මුදලක් අය කර ගෙන ඇති අතර ඉතිරි ණය ශේෂයන්ද අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| | 1,982,094 | (ii) වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගෙන් අයකර ගත යුතු ණය ශේෂයන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව නියමිත කාලවකවානු තුළ ණය මුදල් නිරවුල් කිරීම. විධිමත් පරිදි රාජකාරී ඉවු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2018 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගෙන් අය විය යුතු රු.1,982,094 වන මෙම ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කිරීම සඳහා නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමට අවශ්‍ය නමුත් වසර බොහෝ ගණනක් පැරණි මෙම ලිපිගොනු ලේඛනාගාරයේ මෙතෙක් කළ පරීක්ෂා කිරීම්වලදී සොයා ගැනීමට නොහැකි වී ඇත. තව දුරටත් |

| | | | | |
|---|---|---|---|---|
| | 603,580 | | | ලේඛනාගාරය පරීක්ෂා කිරීමට කටයුතු කරමින් පවතින බැවින් අදාල ලිපිගොනු සොයා ගැනීමෙන් පසුව අදාල අයකිරීම් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| | | (iii) සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව නියමිත කාලවකවානු තුළ ණය මුදල් නිරවුල් කිරීම. විධිමත් පරිදි රාජකාරී ඉටු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. | විගණන නිරීක්ෂණය නිවැරදිය. |
| ▪ XXVIII පරිච්ඡේදයේ 1.3 ඡේදය | | රාජ්‍ය නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් අදාල අංශයන් විසින් පවත්වාගෙන යනු ලබන පැමිණීමේ ලේඛන නිතිපතා මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ඉදිරිපත් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව නිලධාරීන් දැනුවත් කිරීම හා එසේ නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීම. | පැමිණීම සහ පිටවීම නිවැරදිව සටහන් කිරීමටත් අදාල පරිදි නිතිපතා මාණ්ඩලික නිලධාරියෙකුට ඉදිරිපත් කර අධීක්ෂණයට පත් කිරීමටත් අදාල නිලධාරීන් දැනුවත් කර ඇති අතර, දැනට නිසි පරිදි පැමිණීමේ ලේඛනය පවත්වා ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (iii) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u><br>• මු.රෙ.85 (1) (ආ) | ආදායම් වැඩිවීමකට හෝ අඩුවීමකට අදාලව සියලුම ප්‍රයෝජනවත් අදහස් දැක්වීමට ආදායම් ගණන්දීමේ නිලධාරියා සුපරීක්ෂාකාරී විය යුතු වුවද, ආදායම් ගිණුම් 16 ක් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විචලතාවන් පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණයක් සිදුකර හේතු දැක්වීම. | රේගු දෙපාර්තමේන්තුව මඟින් ප්‍රවර්තන වර්ෂයේ ජුනි-අගෝස්තු කාල වකවානුව තුලදී ඉදිරි වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තුව සකස් කරනුයේ පසුගිය වසරවල පැවති දත්ත හා තොරතුරු පදනම් කරගෙනය.<br>නමුත් ප්‍රවර්තන වර්ෂයේ නොවැම්බර් මසදී ඉදිරිපත් කර සම්මත කර ගන්නා අයවැය ලේඛනය සමඟ නව අයවැය යෝජනා ක්‍රියාත්මක වීම නිසා මූලික ඇස්තමේන්තුව සැලකිය යුතු විචලතාවයන්ට භාජනය වේ. නමුත් නව අයවැය යෝජනා වලට අනුරූපීව සංශෝධිත ඇස්තමේන්තුවක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මඟින් පසුව සකස් කර ඉදිරිපත් කරයි.<br>එහෙත් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ වලට අදාලව ඇස්තමේන්තු කරන ආදායම් එකතු වීම තුන්වන පාර්ශ්වයන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් මත රඳා පවතින බැවින් එය රේගුවට පාලනය කල නොහැකිය. එනම් ව්‍යාපාරික ප්‍රජාවගේ හැසිරීම, ලෝක තෙල් මිලේ විචලනය, අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධයෙන් අනෙකුත් රටවලින් ඇතිවන සහන සහ සම්බාදක යන සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය තුලින් ඇතිවන බලපෑම විශ්ලේෂණය කිරිමේදි සියයට 100 ක් නිවැරදිව හා |

| | | | |
|---|---|---|---|
| | | | තාත්වික ආදායම් ඇස්තමේන්තු සැකසීම දුෂ්කර වේ. මෙම දුෂ්කරතාවය යම්තාක් දුරකට හෝ අවම කර ගැනීම සඳහා දැනට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව රේගු ආදායම් කමිටුවක් පත්කර ඇති අතර සියළුම අංශ නියෝජනය වන අයුරින් එහි සාමාජිකයන් පත් කර ඇත. එමෙන්ම එම කමිටුව හරහා ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමට විශේෂිත වූ ආකෘතියක් (Model) සකස් කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම ඇතුළු අනෙකුත් කටයුතු සිදු කරමින් පවතී. මේ තුලින් ඉදිරියේදී වඩා තාත්වික ආදායම් ඇස්තමේන්තුවක් සකස් කිරීමටත් ආදායම් විචලනයන් සඳහා බලපාන හේතු අනාවරණය කර ගැනීමටත් සැලසුම් කර තිබේ. |
| ▪ මු.රෙ 565 (3) | තැන්පතු ලැබීම් හා ගෙවීම් සම්බන්ධයෙන් පාලන ගිණුමක් පවත්වා ගෙන යා යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පාලන ගිණුමක් පවත්වා ගැනීම තුළින් ගිණුම්කරණ කටයුතු පහසු කරවා ගැනීම. | අධික තැන්පතු ලැබීම් හා ගෙවීම් සංඛ්‍යාවක් පවතින බැවින් පාලන ගිණුමක් පවත්වා ගැනීමේ සහ මාසික තැන්පත් සාරාංශයක් පිළියෙල කිරීම ප්‍රායෝගිකව අපහසුවේ. |
| ▪ මු.රෙ 565 (5) | එක් එක් වර්ෂය සඳහා පොදු 71 ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කර මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසයේ අවසන් වීමට ප්‍රථම | රෙගුලාසි ප්‍රකාරව | අධික තැන්පතු ලැබීම් හා ගෙවීම් සංඛ්‍යාවක් පවතින බැවින් මාසික තැන්පත් සාරාංශයක් පිළියෙල කිරීම ප්‍රායෝගිකව අපහසුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කටයුතු කර විගණන කටයුතු සඳහා සහය දැක්වීම. | |
| ▪ මු.රෙ 571 (1) | | නියමිත කාලපරිච්ඡේදය තුල හිමිකම් නොපෑ තැන්පතු පිළිබඳ අර්ධ වාර්ෂිකව ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | | 2016 වර්ෂය වනතෙක් වර්ෂ දෙක ඉක්ම වූ තැන්පතු රජයේ ආදායමට බැර කර ඇති අතර පවතින අධික තැන්පතු ප්‍රමාණය හේතුවෙන් අර්ධ වාර්ෂිකව රජයේ ආදායමට බැර කළ තැන්පතු ලැයිස්තු සකස් කිරීම අපහසු නිසා, වාර්ෂිකව රජයේ ආදායමට බැරකළ යුතු ලැයිස්තු විගණනය වෙත ලබාදී ඇත. |
| (iv) <u>සංශෝධිත මුදල් රෙගුලාසි</u> | | | | |
| ▪ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජූලි 14 දිනැති චක්‍රලේඛ අංක 3/2015 මගින් සංශෝධිත මු.රෙ. 371 (2) | 500,000 | තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක සීමාව ඉක්මවන අවස්ථාවලදී ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය විධිමත්ව ලබාගත යුතු වුවත්, රේගු ප්‍රධාන කාර්යාලයේ ඉන්ධන ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා සමූපකාර අලෙවි මණ්ඩලය (Markfed) වෙත ලබාදී තිබූ අත්තිකාරම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | නියමිත පරිදි භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම. | ඔබගේ නිරීක්ෂණය අනුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 අනුව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. |
| ▪ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජූලි 14 දිනැති චක්‍රලේඛ අංක 3/2015 මගින් සංශෝධිත මු.රෙ. 371 (2) (ආ) | 394,024 | ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 09 දෙනෙකු විසින් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගෙන අග්‍රිමයෙන් සියයට 32 සිට සියයට 100 දක්වා වූ අත ඉතිරි වී තිබූ මුදල් වැඩ කරන දින 16 සිට | විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට අත්තිකාරම් නොපියවන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීම. | ඇතැම් අවස්ථාවලදී යම් යම් කාර්යයන් වෙනුවෙන් අත්තිකාරම් මුදල් ගෙවීම් වැනි කටයුතු සඳහා (උදා: නිවාඩු නිකේතන වෙන්කර ගැනීම්, ආහාර ඇණවුම් කිරීම) නියමිත කාර්යය සිදුකිරීමට දින ගණනකට පෙර අත්තිකාරම් මුදල් ලබා දීමට සිදුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | 184 දක්වා වූ කාලයක් අත රඳවාගෙන තිබුණි. | | |
| ▪ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජුලි 14 දිනැති චක්‍රලේඛ අංක 3/2015 මගින් සංශෝධිත මු.රෙ.371 (5) | 2,378,000 | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල නිශ්චිත කාර්ය අවසන් වීමෙන් දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය ගිණුම් අංශය වෙත පියවිය යුතු වුවද, තත්කාර්ය අග්‍රිම ලබාගන්නා ලද නිලධාරීන් විසින් අවස්ථා 25 කදී අතුරු අග්‍රිම නියමිත කාලය තුළ නිරවුල් කර නොතිබීම හා එම ප්‍රමාද කාලය දින 15 සිට දින 203 ක් වී තිබුණි. | විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට අත්තිකාරම් නොපියවන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීම. | ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල් නොපමාව පියවන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති නමුත් ශ්‍රී ලංකා රේගුවේ ක්‍රියාත්මක වන ස්ථාන මාරු ක්‍රියා පටිපාටිය අනුව නිරන්තරයෙන් නිලධාරීන් ස්ථාන මාරු වන බැවින් අත්තිකාරම් පියවීමේදී ප්‍රමාදයන් ඇතිවේ.<br>ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන මෙන් අදාළ රේගු අධ්‍යක්ෂවරුන් දැනුවත් කරන ලදී. |
| (v) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u> 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය | - | රාජ්‍ය ආයතනවල සියලුම නිලධාරීන් ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර පැමිණීම සහ පිටවීම සටහන් කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ කිසිදු නිලධාරියෙකු එසේ කර නොතිබුණි. | රජයේ පොදු විධාන හා රාජ්‍ය ගිණුම් කාරක සහා නියෝග පිලිපැදීම පිළිබඳ දැඩි ලෙස සැලකිල්ලට ගත යුතු වීම. | ඔබගේ නිරීක්ෂණය කෙරෙහි පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී ද සාකච්ඡා කළ නමුත් ඒ සඳහා අවසන් තීරණයකට එළඹීමට නොහැකි විය. |
| **(vi)** රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 2010 ජුලි 12 දිනැති අංක 209/2010 දරන රාජ්‍ය | **11,672,347,297** | තැන්පතු ලෙජර්වල 2017 දෙසැම්බර් 31 දිනට පැවති අවසාන ශේෂයන් 2018 ජනවාරි 01 වන දින ආරම්භක ශේෂ | විධිමත් පරිදි ලේඛන පැවැත්වීම හා ගිණුම්කරණ කටයුතු නියමිත පරිදි සිදුකර | තැන්පත් ගිණුම් වල දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂයන්ගේ වෙනස්කම් පැවතීම හා විශාල ගණුදෙනු ප්‍රමාණයක් මෙම ගිණුම් යටතේ දෛනිකව සිදු වීම නිසා |

| | | | |
|---|---|---|---|
| ගිණුම් චක්‍රලේඛයේ 4.3.1 ඡේදය | ලෙස තැන්පත් ලෙජර්වලට ගෙන නොතිබුණු අතර එදිනට පැවති තැන්පතු සඳහා උප ලේඛනයක්ද ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය සඳහා සහාය දැක්වීම. | තැන්පතු සඳහා උප ලේඛණයක් ඉදිරිපත් කිරීම අපහසු වී ඇත. |
| (vii) රේගු දෙපාර්තමේන්තු නියෝග 375 (3) - | සියළුම අංශවල හා උප කාර්යාලවල නිලධාරීන් කාර්යාල පරිශ්‍රයෙන් බැහැර යාම සම්බන්ධයෙන් බැහැර යාමේ ලේඛනයක් නඩත්තු කිරීම හා මාණ්ඩලික නිලධාරියෙකු හෝ ස්ථාන බාර නිලධාරීන් විසින් ඒ බව අධීක්ෂණය කිරීම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දුර්වල අභ්‍යන්තර පාලන ලක්ෂණයක් වන අතර තත්ත්වය නිවැරදි කිරීම සඳහා විධිමත් පියවර කඩිනමින් ගැනීම. | නිලධාරීන් දැනුවත් කර ඇත. ඉදිරියේදී නිසි බැහැර යාමේ ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරගෙන යනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

හිඟහිටි ආදායම් රැස්කිරිම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) හිඟ බදු ආදායම්<br>(i) 2018 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු වටිනාකමින් රු.මිලියන 6,370 ක් හෙවත් සියයට 30.36 ක් නියෝජනය කරනු ලබන්නේ හිඟ ආනයනික බදු වලිනි. එයින්ද රු.මිලියන 4,673 ක් 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ හිඟ හිටින ලද බදු වටිනාකම් වේ.<br>(ii) 2018 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායමින් රු.මිලියන 2,884 ක් හෙවත් සියයට 13.75 ක් නියෝජනය කරනු ලබන හිඟ වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු වලින් වන අතර එයින්ද රු.මිලියන 2,664 ක් 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ හිඟ හිටින ලද බදු වටිනාකම් වේ.<br>(iii) 2011 වර්ෂයේදී අහෝසි කරන ලද ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද මගින් 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 42 ක හිඟ බදු ආදායමක් අයවීමට තිබූ අතර 2018 දෙසැම්බර් 31 වන විට එයින් අයවී තිබුණේ රු.මිලියන 12 ක් එනම් සියයට 28.52 ක් පමණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතුව පැවති රු.මිලියන 30 ක වටිනාකම වර්ෂ 2008 සිට 2010 දක්වා කාලපරිච්ඡේදයට අදාල හිඟහිටි වටිනාකම් වේ. | හිඟ බදු නිවැරදිව කාල ප්‍රමාදයකින් තොරව අයකර රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය නිවැරදිය. |
| (iv) 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ බදු ආදායම් වාර්තා අනුව සමස්ථ හිඟ බදු ආදායමින් රු.මිලියන 5,597 කින් නියෝජනය කරන බණිජ තෙල් නිෂ්පාදන බදු ආදායම 2018 වර්ෂයට අදාළව හිඟ හිටව පැවතුනි. එය සමස්ථ හිඟ බදු ආදායමින් සියයට 26.68 ක් වී තිබූ අතර අත්‍යාවශ්‍ය සේවා සඳහා රජයේ ආයතන විසින් ණයට ලබාගත් ඉන්ධන සඳහා අයකර ගැනීම් ප්‍රමාද වීම මත හිඟ හිටීම් පැවතුනි. | හිඟ බදු නිවැරදිව කාල ප්‍රමාදයකින් තොරව අයකර රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය නිවැරදිය. |

| | | | |
|---|---|---|---|
| (v) | 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 20,979 ක සමස්ථ හිඟ බදු ආදායමින් සියයට 0.42 ක් හෙවත් රු.මිලියන 89 ක් නියෝජනය කරනු ලබන්නේ හිඟ මත්පැන් නිෂ්පාදන බදු ආදායම මගිනි. මෙය අදාල සමාගම විසින් ගෙවීම් පැහැර හැරීම නිසා 2001 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති හිඟ ශේෂයක් වී තිබුණි. | හිඟ බදු නිවැරදිව කාල ප්‍රමාදයකින් තොරව අයකර රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. | දඩ මුදල් හා රාජසන්තක කිරීම් පිළිබඳ කටයුතු රේගු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ විසින් සිදු කරන රේගු විමර්ශණ වල අවසන් තීන්දුව අනුව කරනු ලබයි. ඒවාට අදාලව අය කරගෙන ඇති මුදල් විමර්ශණ කටයුතු හා නීතිමය කටයුතු අවසන් වන තෙක් තැන්පත් ගිණුමේ රඳවා තබා ගනි. පරීක්ෂණ ප්‍රතිඵල අනුව නැවත බාහිර පාර්ශව වෙත ගෙවීම් කළ යුතුද නැතිනම් රජයේ ආදායමට හා රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කල යුතු දැයි තීරණය කරනු ලබයි. එසේ අවිනිශ්චිතතාවයක් තිබීම හේතුවෙන් මෙය හිඟ ආදායම් වාර්තාව තුල පෙන්නුම් කරනු නොලැබේ. |
| (vi) | 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් වාර්තා අනුව සමස්ථ හිඟ බදු ආදායමින් රු.මිලියන 1,323 ක් නියෝජනය කරන මෝටර් රථ නිෂ්පාදන බදු ආදායම තුළ රු.මිලියන 328 ක් හෙවත් සියයට 24.78 ක් වර්ෂ 2008 සිට වර්ෂ 2012 දක්වා කාලපරිච්ඡේදයට අදාලව හිඟ හිටීම් විය. | | |
| (vii) | දඩ මුදල් හා රාජසන්තක කිරීම් ආදායම් සංකේතය යටතේ 2018 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 1,630 ක් හිඟ හිටව පැවති අතර ඉන් රු.මිලියන 1,369 ක් 2008 වර්ෂයට පෙර සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව හිඟ හිටව පැවතියද ඒ සම්බන්ධව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාව තුළ අනාවරණය කර නොතිබුණි. | | |

**2.2 වියදම් කළමනාකරණය**

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් වූ නිරික්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | <u>පුනරාවර්ථන වියදම</u><br>සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් වෙනුවෙන් රු.මිලියන 3,269 ක් වෙන් කර තිබුණද, ඉන් සියයට 34 ක් වූ රු.මිලියන 1,101 ක් වියදම් නොකර ඉතිරිව පැවතුණි. ඉතිරිවීම් වාර්තා වූ පුනරාවර්ථන වැය විෂයයන් 09 කට අදාල පැවති ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 16 සිට සියයට 100 දක්වා පරාසයක විය. | - තාත්ත්වික පදනමකින් ඇස්තමේන්තු පිළියෙල කර අයවැය විචලනයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුවීම.<br>- මෙම විචලනයන් මගින් ජාතික අයවැයට ඇති බලපෑම අදාල පාර්ශවයන්ගේ අවධානයට යොමු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ නිවැරදිය. |
| (ආ) | <u>මූලධන වියදම්</u><br>2018 වර්ෂය සඳහා මූලධන වියදම් වෙනුවෙන් වෙන් කර තිබූ රු. මිලියන 346 න් සියයට 68 ක් වූ රු.මිලියන 236 ක් වියදම් නොකර ඉතිරිව පැවතුණි. ඉතිරිවීම් වාර්තා වූ වැය විෂයයන් 08 ක ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 38 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයය අංක 1102 (විදේශ ගමන් වියදම්) හා 1203 (ආහාර පාන හා නිල ඇඳුම්) සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් රු.මිලියන 3.5ක් හා රු.මිලියන 14 ක් ඉතිරි වී තිබුණු අතර එම ප්‍රමාණය වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 90 ක් හා සියයට 36 ක් විය. ඒ අනුව වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී වියදම් මූල්‍යකරණ මාර්ග පිළිබඳ අවධානය යොමු නොකර ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි. ඒ හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තුවල සඳහන් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමේ ඉඩකඩ පැවතීම හේතුවෙන් වියදම් සම්බන්ධ මූල්‍ය පාලනයෙන් බැහැර විය හැකි බව නිරීක්ෂණය විය. | - ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වියදම් මූල්‍යකරන මාර්ග පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතු වීම.<br>- වර්ෂය තුළ ඉටු කළ හැකි කාර්යයන් සඳහා තාත්ත්වික මට්ටමෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම.<br>- අතාත්ත්වික ඇස්තමේන්තු මගින් ජාතික අයවැයට ඇතිවන අහිතකර | වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී රේගු නිළධාරින්ට අමතරව රේගු දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන අනෙකුත් දීප ව්‍යාප්ත සේවාවන්වල නිළධාරින් සඳහාද විදේශ පුහුණුවීම් අවස්ථා පිළිබඳ සලකා බලා ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ. නමුත් 2018 වර්ෂයේ එවැනි පුහුණු අවස්ථා අවම වීම මෙම ප්‍රතිපාදන ඉතිරියට බලපා ඇත.<br><br>2018 නොවැම්බර් මාසය සඳහා රේගු නිළධාරින්ට ආහාර සැපයීම වෙනුවෙන් |

බලපෑම පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානයක් යොමු කිරීම.

වරාය අධිකාරියට ගෙවීමට තිබූ මුදල රු.මිලියන 2.8 කි. ඒ සඳහා ඉදිරිපත් කර තිබූ ඉන්වොයිසියේ පැවති අඩුපාඩුවක් නිවැරදි කර වවුචර්පත් එවීම ප්‍රමාද වීම හේතුවෙන් 2018 වර්ෂය තුළ එම වියදම දැරීමට නොහැකි විය.

මීට අමතරව රේගු දෙපාර්තමේන්තුවේ නිළ ඇඳුම් හිමි කාර්ය මණ්ඩලය සඳහා දැනට පවත්නා නිල ඇඳුම් සංශෝධනය කිරීමට කමිටුවක් පත්කරන ලද අතර එම කමිටු තීරණයන් ලැබීමට කල්ගත වීම හේතුවෙන් 2018 වසර තුළදී නිළ ඇඳුම් රෙදි ප්‍රසම්පාදනය කිරීමට නොහැකි වීමද ප්‍රතිපාදන ඉතිරිය සඳහා හේතු වී ඇත.

(ඇ) වැය විෂය අංක 2001 (ගොඩනැගිලි හා ඉදිකිරීම්) සඳහා රු.මිලියන 120 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් සියයට 82.56 ක් එනම් රු.මිලියන 99 ක ප්‍රතිපාදන ඉතිරිවීම් ලෙස වාර්තා වී තිබුණි. මෙම ඉතිරිවීම් සඳහා හේතු ලෙස අපේක්ෂා කළ පරිදි ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ නොහැකි වීම දක්වා ඇත. යථෝක්ත ප්‍රතිපාදන මුදලින් (රු.මිලියන 120) රු.මිලියන 115 ක්ම වෙන් කර තිබුනේ කටුනායක රේගු විවේකාගාරයේ පස්වන මහල ඉදිකිරීම ඇතුළු අළුත්වැඩියා කටයුතු සඳහා වුවද එම ඉදිකිරීම් සඳහා අවශ්‍ය නෛතික අනුමැතිය 2019 මාර්තු 21 දින වන විටත් ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

- ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වියදම් මූලාකරන මාර්ග පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතු වීම.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන පරිගණක පද්ධතිය වන ආසිකුඩා තොරතුරු තාක්ෂණික පද්ධතිය නඩත්තු

- වර්ෂය තුළ ඉටු කළ හැකි

විගණන නිරීක්ෂණ නිවැරදිය.

| | | | |
|---|---|---|---|
| | කිරීම, පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හා පුහුණු කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අතරින් වැය විෂය අංක 1302 යටතේ රු.මිලියන 7 ක්ද, වැය විෂය අංක 2002 යටතේ රු.මිලියන 17 ක්ද, වැය විෂය අංක 2103 යටතේ රු. මිලියන 15 ක්ද, වැය විෂය අංක 2401 යටතේ රු. මිලියන 10 ක් ඉතිරිවී තිබුණු අතර එම ප්‍රමාණය වෙන් කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 100 ක්, 38.44 ක්, 100 ක් හා 99.75 ක් විය. මෙම ඉතිරිවීම් සඳහා අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම හා අපේක්ෂා කළ පරිදි ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ නොහැකි වීම හේතු වූ බව සඳහන් කර තිබුණි. ඒ අනුව වියදම් ඇස්තමේන්තු කිරීමේදී ව්‍යාපෘති අවශ්‍යතාවය, ධාරිතාවය, විෂය පථය හඳුනා ගැනීමේ දුර්වලතාවය මෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලසුම්වලට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තු වෙන්කිරීම් විශාල වශයෙන් ඉතිරිවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. | කාර්යයන් සඳහා තාත්ත්වික මට්ටමෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම.<br><br>- අතාත්ත්වික ඇස්තමේන්තු මඟින් ජාතික අයවැයට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානයක් යොමු කිරීම. | |
| (ඊ) | වැය විෂයය අංක 1409 (වෙනත්) සඳහා වාර්ෂික ඇස්තමේන්තු වෙන් කිරීම රු.මිලියන 900 කි. එම ප්‍රතිපාදිත මුදලින් රු.මිලියන 840 ක් හෙවත් සියයට 93 ක් කන්ටේනර් ස්කෑන්වලට අදාලව ගෙවීම් කිරීම වෙනුවෙන් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සඳහා වෙන් කල මුදලින් අවස්ථා 06 කදී රු.මිලියන 83 ක් මුදල් රෙගුලාසි 66/69 යටතේ වෙනත් වැය විෂයයන් 9 ක් වෙත මාරු කිරීම් සිදු කර තිබුණි. | - ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වියදම් මූල්‍යකරන මාර්ග පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතු වීම.<br><br>- වර්ෂය තුළ ඉටු කළ හැකි කාර්යයන් සඳහා තාත්ත්වික මට්ටමෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම.<br><br>- අතාත්ත්වික | 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද වරාය පරිශ්‍රය තුළ සවි කිරීමට සැලසුම් කල කන්ටේනර් ස්කෑන් යන්ත්‍ර සවිකිරීමේ ව්‍යාපෘතිය ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩුවක් හේතුවෙන් 2017 වර්ෂය දක්වාද ක්‍රියාත්මක කිරීමට නොහැකිවුණි. 2018 වර්ෂයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේයැයි අපේක්ෂාවෙන් සහ ගරු මුදල් අමාත්‍යවරයාගේ විශේෂ අවධානය යොමුවී තිබූ බැවින් මේ සඳහා ප්‍රතිපාදන වෙන්කරන ලදී. අදාල ව්‍යාපෘතියෙන් ගාස්තු අය කිරීම මත රජයට ආදායමක්ද අපේක්ෂා කල |

| | | | |
|---|---|---|---|
| | | ඇස්තමේන්තු මඟින් ජාතික අයවැයට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානයක් යොමු කිරීම. | බැවින් මෙම ප්‍රතිපාදනය එම ආදායම පදනම් කරගෙන අයවැය හිඟයට බලපෑමක් නොවන අයුරින් වෙන් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු මෙහෙයුම් සඳහා වන වියදම් ඉහත ප්‍රතිපාදන මඟින් දැරීමට සිදු වේයැයි අපේක්ෂා කරන ලදී. දෙපාර්තමේන්තුවේ අනෙකුත් පරිපාලන කටයුතු සඳහා අපේක්ෂා කල වියදම උද්ධමනය හේතුවෙන් සහ චක්‍රලේඛ මඟින් සංයුක්ත දීමනා ගෙවීම් සංශෝධනය වීම මත අනපේක්ෂිත පරිදි ඉහළයාම හේතුවෙන් අවශ්‍ය අමතර ප්‍රතිපාදන සලසා ගැනීම ඉහත ඉතිරි ප්‍රතිපාදනවලින්ම සලසා ගැනීම සිදු කරන ලදී. |
| (ඇ) මුල්‍ය ප්‍රකාශනවලට අනුව 2018 වර්ෂයේ වියදම් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,615 වූ අතර සත්‍ය වියදම රු.මිලියන 2,277 කි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයත් සත්‍ය වියදමත් අතර වෙනස රු.මිලියන 1,337 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 37 කි.<br><br>(ඈ) 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශ ඇතුළත් කරමින් නිකුත් කර තිබූ 2017 ජුලි 25 දිනැති ජාතික අයවැය | - | ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂ කිහිපයක වැය විෂයයන් සඳහා වෙන් කල ප්‍රතිපාදනයෙන් | විගණන නිරීක්ෂණය නිවැරදිය. ඉදිරි ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමට සටහන් |

| | | |
|---|---|---|
| චක්‍රලේඛ අංක 2/2017 සඳහා වරින් වර සිදු කර තිබූ සංශෝධන ප්‍රකාරව 2018 – 2020 මධ්‍යකාලීන සර්ව රාජ්‍ය මූල්‍ය රාමුවේ ප්‍රධාන මූලිකාංග ලෙස පුනරාවර්ථන වියදම් තාර්කිකරණය සහ මූලධන වියදම් ප්‍රමුඛතාගත කිරීම මෙන්ම රජයේ ආදායම් රැස්කිරීම ඉහළ නැංවීම හඳුන්වා දී තිබුණි. එමෙන්ම ඉදිරි වර්ෂයේදී ඇති විය හැකි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අභියෝගවලට මුහුණදීම හා මෙරට සමාජ ආර්ථික සංවර්ධනය නංවාලීම යනාදී අරමුණු අවධාරණය කර තිබුණි.<br><br>එහෙත් 2018 වර්ෂය තුළ ශ්‍රී ලංකා රේගුවේ පුද්ගල පඩිනඩි හැර පුනරාවර්ථන වියදම් හා රු.මිලියන 1,471 ක් හා රු.මිලියන 346 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,817 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද වර්ෂය අවසානය වන විට පුනරාවර්ථන (පුද්ගල පඩිනඩි හැර) හා මූලධන වියදම් සඳහා වෙන් කළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.මිලියන769 ක් හෙවත් සියයට 52 ක් හා රු.මිලියන 236 ක් හෙවත් සියයට 68 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රේගුවේ පුනරාවර්ථන හා මූලධන වියදම් ප්‍රතිපාදන වෙන් කිරීමේදී මෙන්ම එම ප්‍රතිපාදන වැය කිරීමේදී යථෝක්ත චක්‍රලේඛ අවශ්‍යතාවයන් ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | සැසඳීමක් සිදු කර ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් පුරෝකථනය කිරීම එමඟින් වැය විෂයයන් සඳහා අනවශ්‍යය ලෙස ප්‍රතිපාදන සැලසීම වළක්වාගත යුතුවීම<br><br>- මෙවැනි අතාත්ත්වික ඇස්තමේන්තු විචලතාවයන් නිසා ජාතික අයවැයට ඇතිවන අහිතකර බලපෑම නිලධාරීන්ගේ දැඩි අවධානයට යොමු කළ යුතු වීම. | කරගන්නා ලදී. කෙසේ වුවද සැලසුම් කරන ලද පරිදි අදාල කටයුතු සිදු කර ගෙවීම් සිදු කිරීමට යාමේදී භාණ්ඩාගාර අක්මුදල් ලබා ගැනීමද ගැටළු සහගත වන බැවින් ප්‍රතිපාදන ඉතිරිවීම සඳහා ද එයද හේතු වූ බව කාරුණිකව දන්වමි. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

බැරකම්වලට එළඹීමට අදාලව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 94(1), 2017 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 263/2017 හි 03 (ඊ), 2018 ඔක්තෝබර් 19 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 266/2018 හි 4:11 හා 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3:4 යන මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් වැය විෂයයන් 07 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 16.73 ක් වූ බැරකම්වලට එළැඹ තිබුණි | පවත්නා නීතිරීති ගැන නිලධාරීන්ගේ දැඩි අවධානය යොමු කළ යුතුවීම.<br>අනුමත ප්‍රතිපාදන සීමා ඉක්මවා බැරකම් ඇති කර නොගැනීම. | විගණන නිරීක්ෂණය නිවැරදිය. |
| (ආ) **බැරකම් නිවැරදිව අනාවරණය නොකිරීම** | | |
| (i) 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනට වූ සියළු බැරකම් සටහන (iii) බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය මගින් හෙළිදරව් කළ යුතු වුවත්, එකතුව රු.මිලියන 26.5 ක් වූ බැරකම් විසර්ජන ගිණුම තුල අනාවරණය කර නොතිබුණි. | බැරකම් නිවැරදිව ගණනය කර අදාල ආකෘතිවල ඇතුළත් කිරීම. | රේගුවේ විවිධ අංශ හරහා බැදීම් හා බැරකම් විශාල ප්‍රමාණයක් ඇතිවන බැවින් එම විස්තර නිවැරදිව මුදල් අංශයට ලබා ගැනීමට නොහැකි වීම තුල මෙම අඩුපාඩුව සිදු වී ඇති අතර එම තත්ත්වය අවම කිරීමට කටයුතු කරමි. |
| (ii) එමෙන්ම 2018 ඔක්තෝබර් 19 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 266/2018 හි 4:11 විධිවිධාන ප්‍රකාරව ගලපන ලද බැදීම් හා බැරකම් පිළිබඳ වාර්තාව ඇමුණුම 01 වශයෙන් පළමු පරිපූරක ගිණුම් සාරාංශය මගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු වුවද, රු.මිලියන 26.5 ක් වූ බැරකම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත හෙළිදරව් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන දත්ත නිවැරදිව, කාලීනව ඉදිරිපත් කළ යුතුවීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 266/2018 හි 4.11 විධිවිධාන ප්‍රකාරව ගලපන ලද බැදීම් හා බැරකම් පිළිබඳ වාර්තාව පළමු පරිපූරක ගිණුම් සාරාංශය මගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර **www.newcigas.gov.lk** වෙබ් අඩවිය වෙත **Upload** කර ඇත. එසේ වුවද පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීමෙන් පසුව |

හඳුනාගන්නා ලද බැරකම් පිළිබඳ තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර නොමැති බව කාරුණිකව දන්වමි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත 16 කට අදාලව ඇස්තමේන්තු කර තිබූ මුළු ආදායම රු.831,290,000,000 වුවද වර්ෂය තුළ රැස් කර තිබූ ශුද්ධ ආදායම ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 86.16 ක් එනම් රු.716,277,377,520 කි. අපේක්ෂිත නිමවුම් මට්ටම ළඟා කර ගත නොහැකි වූ ආදායම් සංකේතවලට අදාල විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ආදායම් ලැබීම්<br>I. සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් එක් රැස්කරන ලද සමස්ථ ශුද්ධ ආදායම රු.මිලියන 716,277 ක් වූ අතර එයින් ආනයන බදු ආදායම් සංකේතය යටතේ රැස්කර තිබූ ආදායම රු.මිලියන 97,071 ක් විය. පසුගිය වර්ෂයේදී රැස් කර තිබූ රු.මිලියන 136,501 ක ආදායම සමඟ සැසඳීමේදී රු.මිලියන 39,429 කින් අඩුවී තිබුණි.<br><br>II. සමාලෝචිත වර්ෂයේදී ආනයන සෙස් බදු ආදායම් සංකේතය යටතේ රු.මිලියන 50,790 ක ආදායමක් රැස්කරගෙන තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෙම ආදායම් සංකේතය යටතේ රැස් කළ ආදායම රු.මිලියන 56,574 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 5,784 කින් හෙවත් සියයට 10.22 කින් අඩු වී තිබුණි.<br><br>III. සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා | ආදායම වර්ධනයන් ඇති කර ගැනීම සඳහා උපරිම අයුරින් කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණ නිවැරදිය. |

රේගුව අපනයන සෙස් බදු ආදායම් සංකේත යටතේ රු.මිලියන 2,591 ක ආදායමක් එකතු කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෙම ආදායම් සංකේතය යටතේ එකතු කළ ආදායම රු.මිලියන 2,980 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 388 කින් හෙවත් සියයට 13.03 කින් අඩු වී තිබුණි.

| | | |
|---|---|---|
| IV. ශ්‍රී ලංකා රේගුව විසින් රැස්කරමින් තිබූ මත්පැන් නිෂ්පාදන බද්ද, 2002 මාර්තු 22 දිනැති අංක 1228/14 දරන මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් 2002 මාර්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර තිබුණි. පසුව 2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/29 දරන මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් මත්පැන් නිෂ්පාදන බද්දක් පනවා තිබුණි. ඒ අනුව 2018 වර්ෂයට අදාලව රැස් කළ ආදායම රු.මිලියන 53 ක් වූ අතර 2017 වර්ෂයට සාපේක්ෂව එය රු.මිලියන 416 කින් හෙවත් සියයට 88.65 ක අඩුවීමකි. | හිඟ බදු ආදායම කඩිනම්ව අයකර ගත යුතු වීම. | විගණන නිරීක්ෂණ නිවැරදිය. |
| V. සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ මුළු ශුද්ධ ආදායම වන රු.මිලියන 716,277 න් රු.මිලියන 66,318 ක් හෙවත් සියයට 9.25 ක් නියෝජනය කරන ඛණිජ තෙල් නිෂ්පාදන බද්ද පෙර වර්ෂයට වඩා රු.මිලියන 7,664 කින් හෙවත් සියයට 10.36 කින් අඩුවී තිබූ බව නිරීක්ෂණය විය. | | |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කල යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2019 ජුනි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා රේගුවේ නිවාරණ අංශයේ නිලධාරීන්ට නිල ඇඳුම් උපාංග සැපයීම වෙනුවෙන් එහි සේවා සැපයුම් අංශය විසින් සිදු කර තිබූ රු.මිලියන 14 ක් වූ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුණි.<br>(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4 මාර්ගෝපදේශයට පටහැනිව ජාතික තරඟකාරී මිල කැඳවීම් ක්‍රමය වෙනුවට වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය (Shopping) අනුගමනය කර තිබුණි. එසේම 8:9:1(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මෙම ප්‍රසම්පාදනය සඳහා විධිමත් ගිවිසුමක් නොවීය.<br>(ආ) ලංසුකරුගෙන් මිල ගණන් විමසා යැවූ ලිපිය දින රහිත එකක් වීම, තෝරාගත් ලංසුකරු ලංසු ලේඛණ සම්පූර්ණ කර නොතිබීම, නියමිත ලංසු ලේඛන මගින් නොව ලංසුකරුට පෞද්ගලික වූ ලිපියක් මගින් මිල ගණන් ඉදිරිපත් කර තිබීම, ප්‍රසම්පාදන කාලසීමාව අතරතුර සේවා සැපයීම් අංශය විසින් විධිමත් ඇණවුමක් රහිතව වරින් වර භාණ්ඩ ලබාගැනීමට කටයුතු කිරීම, මිල ගණන් විමසමින් නියමිත ලංසු ලේඛන ඇතුලත් ලිපි භාරදුන් බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවීම සහ ලංසු ලේඛන භාර ගැනීමේදී ලියාපදිංචි තැපැලෙන් හෝ මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියක් | - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපරිම ලෙස පිළිපදිමින් ප්‍රශස්ථ ලෙස හා කාර්යක්ෂම ලෙස කාර්යයන් ඉටු කරවා ගැනීම.<br>- විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකළ පාර්ශව හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීම.<br>- රජයට උපරිම වාසියක් සැලසෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් නිලධාරීන්ට නොමැති වීම හේතුවෙන් මෙවැනි අඩුපාඩු සිදු වී ඇති අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

| | | |
|---|---|---|
| මගින් සිදු කර නොතිබීම යනාදි අඩුපාඩු පැවතීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6:3:1 මාර්ගෝපදේශය හා මු.රෙ. 695, 695 (2), 695 (3) අනුව සිදු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. | - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපරිම ලෙස පිළිපදිමින් ප්‍රශස්ථ ලෙස හා කාර්යක්ෂම ලෙස කාර්යයන් ඉටු කරවා ගැනීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් නිලධාරීන්ට නොමැති වීම හේතුවෙන් මෙවැනි අඩුපාඩු සිදු වී ඇති අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ඇ) විගණිත දිනය වූ 2018 මැයි 15 දිනට නිවාරණ අංශයේ නිල ඇඳුම් අවශ්‍යතාවය නිලධාරීන් 713 ක් වුවද 2017/18 වර්ෂය සඳහා සියළුම රේගු නිලධාරීන් පදනම් කරගෙන මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා නිල ඇඳුම් අයිතමයන් 59,523 ක් වෙනුවෙන් රු.මිලියන 14 ක වැයක් දැරීමට සිදුවී තිබුණි. එයින් සියයට 70 ක් හෙවත් රු. මිලියන 9 ක් වටිනා උපාංග 41,899 ක් ම නිවාරණ අංශයේ අවශ්‍යතාවය ඉක්මවා මිලදී ගැනීමක් බව නිරීක්ෂණය විය. | - විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකළ පාර්ශව හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීම.<br>- රජයට උපරිම වාසියක් සැලසෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම. | |
| (ඈ) මිලදී ගත යුතු ප්‍රමාණය නිශ්චය කිරීම නිවාරණ අංශය විසින් සිදු කළ යුතු වුවද එය සේවා හා සැපයුම් අංශය විසින් සිදු කර තිබුණි. එසේම නිවාරණ අංශයට හා තාක්ෂණික ඇගයීම් කමිටුවට නිවැරදි නොවන තොරතුරු ලබා දී " **සියලුම රේගු නිලධාරීන්ට ඉදිරි වසර 03 ක් සඳහා** " මෙම මිලදී ගැනීම සිදුකර තිබුණි. | - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් නිලධාරීන්ට නොමැති වීම හේතුවෙන් මෙවැනි අඩුපාඩු සිදු වී ඇති අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා මුදල් රෙගුලාසි අනුව කටයුතු |

| | | |
|---|---|---|
| (ඉ) සැපයුම්කරු තෝරා ගැනීමෙන් පසුව ද ලංසු ලේඛනවල ඇතුලත් කර තිබූ ඒකක ප්‍රමාණය සියයට 20 සිට සියයට 400 දක්වා අසාමාන්‍ය ලෙස වැඩි කර තිබූ අතර ප්‍රසම්පාදන කමිටුව අනුමත කර තිබූ ප්‍රමාණයද ඉක්මවා රු.මිලියන 2.3 ක් වටිනා නිල ඇඳුම් උපාංග මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. තවද, 2018 මැයි 30 දින වන විට ඉහත ප්‍රසම්පාදන වටිනාකමින් සියයට 58 හෙවත් රු.මිලියන 8 ක් වටිනා උපාංග 41,303 ක් නිකුත් කිරීමකින් තොරව ගබඩාවේ පැවතුණි. | උපරිම ලෙස පිළිපදිමින් ප්‍රශස්ථ ලෙස හා කාර්යක්ෂම ලෙස කාර්යයන් ඉටු කරවා ගැනීම.<br>- විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකළ පාර්ශව හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීම.<br>- රජයට උපරිම වාසියක් සැලසෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම. | කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| ශ්‍රී ලංකා රේගුව සතුව කොම්පඤ්ඤ වීදියේ මෝගන් පාරේ පිහිටි රජයේ නිවාස 18 කින් සමන්විතව පැවති නිවාස සංකීර්ණයක වර්තමානය වනවිට නිවාස 08 ක් පමණක් ඉතිරිව පවතින බවත් අනෙකුත් නිවාස විනාශ වී ඇති බවත් නිරීක්ෂණය විය. එමෙන්ම ශ්‍රී ලංකා රේගුවට අයත් මෙම භූමි භාගයේ බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් නිවාස 02 ක් ඉදිකර ජලය හා විදුලි පහසුකම් ද ලබාගෙන තිබුණද එම අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය.<br>2017 වර්ෂයේදී මෙම නිවාස සංකීර්ණයේ නිවාස 02 ක් රු.607,319 ක වියදමක් දරා ප්‍රතිසංස්කරණය කර තිබූ අතර පිළිවෙලින් රු.411,000 ක් හා රු.60,000 ක් වැය කර ඇඳන් 06 ක් හා මෙටට් 12 ක් මිලදී ගෙන තිබුණද විගණිත දිනය වන විටත් (2018 මැයි) මෙම නිවාස 02 භාවිතයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | රාජ්‍ය දේපල අවභාවිතය, වැලැක්වීමට පියවර ගැනීම, දේපල සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම, දේපළ ඵලදායී කාර්යයන් සඳහා යොමු කිරීමට කටයුතු කළ යුතු වීම. | කොම්පඤ්ඤ වීදිය, මෝගන් පාරේ පිහිටි අංක 40/11 දරන නිවස නිලධාරීන් 12 දෙනෙකු සඳහා ලබාදීමට කටයුතු යොදා තිබුණි. එසේ වුවද එම නිලධාරීන්ට ලැබුණු ස්ථානමාරුවීම් හේතුවෙන් එම නිවස අනවශ්‍ය බව පසුව දන්වන ලදී. දැනට මෙම නිවාස රේගු පරීක්ෂකවරුන්ට ලබාදීමට කටයුතු කරමින් පවතී.<br>විනාශ වූ දේපල ප්‍රතිසංස්කරණය කර රේගු නිලධාරීන් සඳහා පුහුණු ආයතනයක් ඉදිකිරීම පිළිබඳව ද අධ්‍යයනය කරනු ලැබේ.<br>මෝගන් පාරේ රේගු දෙපාර්තමේන්තුවට අයත් භූමිය තුළ සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කර දෙන ලෙස 2017 ජනවාරි 16 දින අංක CIB & 320/138 යටතේ කොම්පඤ්ඤ වීදියේ පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්, |

| | | |
|---|---|---|
| | | කොළඹ දැනුවත් කර ඇත. එසේම මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මගේ අංක LOG/S/04-2016 හා 2017 ජුනි 15 දිනැති ලිපියෙන් නියෝජ්‍ය පොලිස්පති (බස්නාහිර පළාත - දකුණ) වෙතින්ද ඉල්ලා ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්, කොළඹ විසින් අදාල ග්‍රාම නිලධාරී වෙතින් ලබාගත් වාර්තාව මේ වන විට එවා ඇත. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී. |

### 3.5 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | ආනයන හා අපනයන පාලක විසින් පනවනු ලබන රෙගුලාසි අනුව ආයු කාලය ඉක්ම වූ පැරණි වාහන ආනයනයේදී ආනයන හා අපනයන බලපත්‍රයක් ලබාගෙන ආනයනය කළ යුතු වුවද එසේ නිසි බලපත්‍රයක් ලබා නොගෙන අවස්ථා 11 කදී රේගුවෙන් වාහන නිදහස් කරගෙන තිබුණි. | පවත්නා විධිවිධාන අනුව කටයුතු කිරීම හා එසේ නොකරන නිලධාරීන් පිළිබඳව සොයා බලා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| **(ii)** | ආනයන හා අපනයන පාලක විසින් බලපත්‍රයක් නිකුත් කර තිබුණද, නියමිත පරිදි බලපත්‍ර කොන්දේසි අනුව ආනයනය කර ඇති බවට ආනයන හා අපනයන පාලක විසින් හර නිවේදනයක් නිකුත් කළ පසු භාණ්ඩ රේගුවෙන් නිදහස් කළ යුතු වුවත්, එසේ හර නිවේදන නිකුත් නොකල අවස්ථා 04 කදී වාහන රේගුවෙන් නිදහස් කරගෙන තිබුණි. | තත්ත්වය විධිමත් කිරීම හා අවිධිමත් ලෙස කටයුතු කර ඇති පාර්ශව පිළිබඳව විධිමත් පරිදි සොයා බලා අවශ්‍ය පියවර ගැනීම. | |
| **(iii)** | ආනයනකරුවෙකු වෙත ට්‍රක් රථ 02 ක් මිලදී ගැනීම සඳහා නිකුත් කළ අංක **IM-2-150-2018-000397-0001** දරන බලපත්‍රය පදනම් කරගෙන ආනයනය කළ මාර්ග ඉදිකිරීම සඳහා | වාහන බදු අයකිරීමේ ප්‍රතිපත්තිය නිවැරදිව ක්‍රියාත්මක කළ යුතු වීම, එසේ නොකිරීම නිසා ඇති වී ඇති අලාභය වගකිව යුතු | |

| | | | |
|---|---|---|---|
| | භාවිතා කරනු ලබන ට්‍රක් රථයක් සඳහා වූ රේගු සංයෝජිත වර්ගීකරණ අංකය වෙනස් කර විශේෂ කාර්ය වාහන කාණ්ඩය (8705.90.94) යටතේ නිශ්කාෂණය කිරීම හේතුවෙන් අහිමි වී තිබූ බදු ආදායම රු.1,315,381 ක් බව නිරීක්ෂණය විය. | පාර්ශවයන්ගෙන් අයකර ගැනීම. | |
| **(iv)** | වැසි අංක **FKH17F2-72001**9 දරන **Mitsubishi** ගිනි නිවන රථය පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අතර මෙය 1988 වර්ෂයේදී නිෂ්පාදිත රථයක් වූ බැවින් ආනයන බලපත්‍රයක් සහිතව ආනයනය කළ යුතු වුවද එසේ නොවීම හේතුවෙන් 2015 වර්ෂයේදී තහනම් කළ යුතුව තිබූ මෙම රථය වර්ෂ 03 කට පසුව රාජසන්තක කිරීම සඳහා නියෝග ලබා දී තිබුණි. | පැරණි වාහන ආනයනයේදී ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරන ආනයන බලපත්‍ර ලබාගත යුතුවීම හා එසේ නොකිරීම නිසා ඇති වූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම. | KF417FZ – 720019 දරන Mitsubishi ගිනි නිවීමේ රථය සම්බන්ධයෙන් ගැටළුවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් මතු නොවුණි. මෙම රථය ශ්‍රී ලංකා යුධ හමුදාවට පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු අතර එම රථය වර්ෂ 1988 දී නිෂ්පාදිත පැරණි වාහනයක් බැවින් ධාවන තත්ත්වය හා ක්‍රියාකාරීත්වය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි වීම යන හේතුව මත ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් නිශ්කාශනය සඳහා ආනයන බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි. ආනයනය වන විටත් මෙම වාහනයේ බැටරි ක්‍රියාකාරීත්වය දුර්වලව තිබූ අතර, මෙය රේගුව භාරයට ගෙන කොළඹ මට්ටක්කුලිය වාහන අංගනයට රැගෙන ඒම ප්‍රායෝගික දුෂ්කර කාර්යයක් බවට අවබෝධ විය. එසේම හම්බන්තොට වරායේ වාහනයක් පවරාගෙන කොළඹට රැගෙන ඒමට අමතර වාහනයක්, අමතර රියදුරන්, සහායක නිලධාරීන්, අවශ්‍ය උපකරණ, මෙවලම් සූදානම් කරගත යුතු බැවින් වෙන් වෙන් |

අවස්ථා තුනකදී වෙන වෙනම වාහන ගෙන ඒමට වඩා වාහන තුන එකවර ගෙන ඒමේදී පිරිවැය අඩුවන බැවින් වාහන එකවර ගෙන ඒමට තීරණය කරන ලදී.

වැසි අංක KF417FZ – 720019 දරන Mitsubishi ගිනි නිවීමේ රථය නොපමාව රේගු භාරයට ගැනීම හා ඒ සම්බන්ධ රේගු පරීක්ෂණයක් (Customs Inquiry) පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

## 3.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශාක නිරෝධායන සේවයේ අනුමැතියකින් තොරව ආනයනය කර තිබූ මි.ර.ගැ. වටිනාකම රු.2,148,757 ක් වූ ඉඟුරු කි.ග්‍රෑ. 34,640 ක් අඩංගු බහාළුම් ආනයනය කර තිබූ ආනයනයකරුවන් තිදෙනෙකු සම්බන්ධයෙන් ආරම්භ කර තිබූ රේගු විමර්ශනයන් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව අවසන් කර තිබූ බව නිරීක්ෂණය විය. අදාල ආනයනකරුවන් විසින් ආනයන අනුමැතීන්ට අදාලව විමර්ශන නිලධාරීන්ට ඉදිරිපත් කර තිබූ ලේඛන ව්‍යාජ ඒවා වුවද, එම ලේඛනවල නිරවද්‍යතාවය පිළිබඳ පරීක්ෂා කිරීමට රේගු නිලධාරීන් කටයුතු කර නොතිබුණි. | රේගු නීතිය හා ඊට අදාල ආනයන හා අපනයන නීතිරීති රෙගුලාසි හා වෙනත් නෛතික විධිවිධාන ගැන ගැඹුරු ලෙස අධ්‍යයනය කර රජයේ බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතු වීම හා ලිපිලේඛනවල නිවැරදිතාවය තහවුරු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි සොයා බලා පියවර ගත යුතු වීම හා සිදුවී ඇති අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම. | |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබානොගෙන මෙරටට ආනයනය කර තිබූ වසර 10 කට වඩා පැරණි වාහන 04 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ නිවාරණ අංශය රේගු විමර්ශනයක් ආරම්භ කර තිබුණද, ආනයනකරු විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාජ ලේඛන මත එම වාහන නැවත ආනයනකරු වෙත නිදහස් කිරීමට රේගු නිලධාරීන් විසින් කටයුතු කර තිබුණි. | ලේඛනවල නිවැරදිතාවය තහවුරු කර නොගැනීම නිසා රජයට සිදුව ඇති අලාභය විධිමත් පරිදි සොයා බලා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම, ව්‍යාජ ලේඛන ඉදිරිපත් කළ පාර්ශවය පිළිබඳ රටේ පවත්නා නීතිය අනුව කටයුතු කිරීම. | මෙම සම්බන්ධයෙන් මූලික විමර්ශන හා රේගු විමර්ශන ආරම්භ කර ඇත. |
| **(iii)** | භාණ්ඩ ආනයන හා අපනයන ක්‍රියාවලියේදී, ලේඛන පරීක්ෂාව හා භාණ්ඩ භෞතික පරීක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව තුල ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් නිශ්කාෂණ නියෝජිතයන් ලෙස කටයුතු කරන වාප්පු ලිපිකරුවන් හා රේගු නිලධාරීන් අතර සමීප සම්බන්ධතාවයක් ගොඩනැගිය හැකිවීමේ අවධානමක් නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් භාණ්ඩ ඌණ තක්සේරු කිරීම, ආනයනික භාණ්ඩ නියමිත පරිදි ප්‍රකාශ නොකිරීම යනාදී අක්‍රමිකතාවයන් තුලින් රජයේ බදු ආදායම අහිමි වීම මෙන්ම නීති විරෝධී හා තහනම් භාණ්ඩ ආනයනයන් අනාවරණය නොවීමේ අවදානමක් පවතින බව පසුගිය විගණන විමසුම් හා වාර්තා මගින් දිගින් දිගටම අනාවරණය කර තිබුණි. එහෙත් එම තත්ත්වය නිවැරදි කිරීමට හා නව ක්‍රමවේදයක් හඳුන්වාදීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කර ඇති බවද නිරීක්ෂණය නොවීය. සමාලෝචිත වර්ෂයේදී මේ සම්බන්ධයෙන් සිදු කල විගණන පරීක්ෂාවේදී, නිරීක්ෂණය වූයේ ආනයනයකරුවකු විසින් අවස්ථා 6 කදී රු.39,335,091 ක් වටිනා සුවඳ | - ආනයනකරුවන් විසින් සිදුකරන විවිධ ආකාරයේ රේගු බදු වංචා පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානය යොමු කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කළ යුතුවීම.<br><br>- වංචාව සඳහා අනුබල දී ඇති පාර්ශව පිළිබඳව ගැඹුරින් සොයා බලා අවශ්‍ය පියවර ගැනීම.<br><br>- ආයතන සංග්‍රහයේ II ප්‍රකාරව විනය පියවර ගැනීම හා නීතිමය පියවර ගැනීම. | |

| | | | |
|---|---|---|---|
| | විලවුන් අඩංගු බහාළුම් 06 ක් බටහිර ඖෂධ ලෙස ප්‍රකාශ කර නිදහස් කර ගෙන තිබීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට රු.40,761,600 ක ආදායමක් අහිමි වී තිබුණු බවයි. ශ්‍රී ලංකා රේගුවේ ලේඛන හා භාණ්ඩ භෞතික පරීක්ෂාව සිදු කල රේගු නිලධාරීන්ගේ සම්බන්ධතාවයකින් තොරව මෙවැනි අක්‍රමිකතාවයක් සිදු කල හැකිද යන්න විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | | |
| **(iv)** | රේගු නිලධාරින්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන්, නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් විදේශ පුහුණුවීම් වලට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු.1,125,496 ක් වියදමක් දරා තිබුණ ද ඔවුන් එම විදේශීය වැඩමුළු පැවැත්වූ කාලසීමාව තුල දෙපාර්තමේන්තුව තුළ සේවයේ යෙදී ඇති බවට වාර්තා කරමින් අතිකාල මුදල් ලෙස රු.8,333 ක් ලබා ගෙන තිබූ බවද නිරීක්ෂණය විය. | - අක්‍රමිකතාවයන් සිදුකර ඇති නම් ඒ සඳහා පවත්නා විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම.<br>- සේවක පරිපාලනය සම්බන්ධ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම.<br>- ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම මගින් නීත්‍යානුකූල නොවන ලෙස රාජ්‍ය මුදල් ලබා ගැනීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. | විගණන නිරීක්ෂනයේ සඳහන් විදේශ පුහුණු වැඩසටහන් (රාජකාරි) සඳහා සහභාගි වී ඇති නිලධාරීන් විදේශගත කාලසීමාවන් තුල අතිකාල සේවයේ යෙදී ඇති බවට අදාල අතිකාල අත්සන් ලේඛණයේ ඒ ඒ අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කර එවා ඇති අතර, ඒ සම්බන්ධයෙන් අදාල අධ්‍යක්ෂවරුන්ගෙන් මේවන විට කරුණු විමසා ඇත.<br><br>එමෙන්ම විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන්ගෙන් එම කාලසීමාවන් සඳහා ගෙවා ඇති අතිකාල දීමනා වහාම ආපසු ඇපකර ගැනීමට කටයුතු කර ඇත. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රේගු විමර්ශනයන්ට අදාලව රේගු භාරයට ගන්නා වාහන හා බහාළුම් මෙන්ම රාජසන්තක කල වාහන හා බහාළුම් රඳවා තබා ගැනීම සඳහා රු.මිලියන 1 ක මාසික කුලී පදනම මත මට්ටක්කුලිය ප්‍රදේශයේ පිහිටි ගබඩාවක් සහිත ඉඩමක් (Salt Yard) පෞද්ගලික අංශයෙන් ලබා ගෙන තිබුණි. මේ සඳහා 2016 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් මාසය දක්වා කාලපරිච්ඡේදය සඳහා එකතුව රු.මිලියන 29.6 ක මුදලක් මාසික කුලී මුදල් වශයෙන් ඒකාබද්ධ අරමුදලින් ගෙවා තිබුණි. මෙම අංගනයේ වසර 1 සිට 21 දක්වා කාලයක් රේගු භාරයේ රඳවා ඇති විවිධ මාදිලියේ වාහන 146 ක ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය වූ අතර බොහෝ වාහන ප්‍රමාණයක් භාවිතයට ගත නොහැකි අයුරින් දිරා ගොස්/ දිරා යමින් පවතින අතර එම වාහන අපහරණය කර කිසියම් හෝ ආදායමක් ලබා ගැනීමට ඇති හැකියාවද අවිනිශ්චිත බව තවදුරටත් නිරීක්ෂණය විය. මෙම වාහන අපහරණය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට විගණන පරීක්ෂාව සිදු කල දින වන විටත් ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | - වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගත යුතුවීම.<br>- විමර්ශන කටයුතු කඩිනම් කර වාහන අනවශ්‍ය ලෙස රඳවා ගැනීමෙන් සිදුවිය හැකි අලාභය අවම කරවා ගැනීම.<br>- නෛතික කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම.<br>- රජයේ අරමුදලින් සිදු කරන ලද ගෙවීම්වලට ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභයක් අත්පත් කර ගැනීමට නිලධාරීන්ගේ අවධානය යොමු කළ යුතු වීම. | ඉදිරි මාස 03 ඇතුළත මෙම වාහන විකිණීම හෝ අපහරණය සිදු කරනු ලැබේ. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කටුනායක බණ්ඩාරණායක අන්තර්ජාතික ගුවන්තොටුපලේ පිටවීමේ පර්යන්තය හරහා 2015 ජුනි 28 දින ශ්‍රී ලංකා මුදලින් රු.මිලියන 16.8 ක් වටිනා විදේශ විනිමය නීති විරෝධීව රැගෙන යාමට උත්සාහ කල පුද්ගලයෙකු | - නීතියට පටහැනිව ක්‍රියාකර ඇතිද යන්න පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය පියවර ගැනීම.<br>- මෙවැනි නීත්‍යානුකූල නොවන ක්‍රියා වලක්වා ගැනීමට උපරිම අයුරින් | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගු මධ්‍යම විමර්ශන අංශය විසින් පරීක්ෂණයක් පවත්වා තිබුණි. විමර්ශනය අවසානයේ අදාල පාර්ශවයට පනවා තිබූ රු.මිලියන 3 ක දණ්ඩන මුදල පසුව රු.මිලියන 1.5 ක් දක්වා අඩු කිරීමට එවකට සිටි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කර තිබුණු අතර මෙම ලිහිල් කිරීම රේගු ආඥා පනතට පටහැනි බව 2016 මාර්තු 02 දිනැති හා අංක PUR/A/CUS/2015/09 දරණ විගණන විමසුමෙන් පෙන්වා දෙන ලදී. එමෙන්ම එම තීරණය අභියෝගයට ලක් කරමින් පාර්ශව කිහිපයක් අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමට ද කටයුතු කර තිබුණි. එම පෙත්සම් විභාගය අවසානයේදී ද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කර තිබූ ලිහිල් කිරීම රේගු ආඥා පනතට පටහැනිබවට තීරණය කර තිබුණි. ඒ අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය හේතුවෙන් අහිමි වී ඇති රු.මිලියන 1.5 ක මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකිරීම. | |
| (ආ) | පාම් ඔයිල් තොග වශයෙන් ආනයනය කරනු ලබන ප්‍රධාන පෙලේ ආයතන 02 ක් විසින් 2013 – 2016 කාලපරිච්ඡේදය තුල ආනයනය කර තිබූ පාම් ඕලේන් (Palm Olein) නැමැති තෙල් වර්ගය නිවැරදි භාණ්ඩ සංයෝජිත වර්ගීකරණයක් යටතේ නිශ්කාෂණය නොකිරීම හේතුවෙන් රු.මිලියන 6,130 කට ආසන්න බදු මුදලක් අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ආනයනයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ බුද්ධි අංශය විසින් රේගු විමර්ශනයක් ආරම්භ කර තිබුණද, ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංශයේ හා | - භාණ්ඩ වර්ගීකරණ අංශය හෝ **NC** කමිටුව වෙත ලැබෙන විමසුම් සඳහා නිශ්චිත කාලයක් තුළදී විසඳුම් ලබා දීම.<br>- ශ්‍රී ලංකා රේගුවේ සමස්ථ කාර්ය මණ්ඩලය අන්‍යෝන්‍ය ලෙස රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමේ අරමුණින් කටයුතු කළ යුතු බව අවධාරණය කිරීම.<br>- රේගු විමර්ශනවලින් අනාවරණය කරගන්නා රේගු වැරදි සඳහා අනුබල | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | NC කමිටු නිලධාරීන් විසින් ආනයනකරුවන් නිවැරදිය යන පදනමින් කටයුතු කර තිබීම හේතුවෙන් රේගු විමර්ශනය අවසන් කිරීම ප්‍රමාද වී තිබුණි. ලෝක රේගු සංවිධානය තහවුරු කිරීම අනුවද මෙම ආනයනයන් මගින් රජයේ බදු ආදායම අහිමි වී ඇති බව නිරීක්ෂණය වුවද, එම මුදල් අය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දී ඇති නිලධාරීන්, වාප්පු ලිපිකරුවන් සහ වෙනත් පාර්ශවයන් වෙත දැඩිව නීතිය ක්‍රියාත්මක කර රජයට සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කිරීමේ හැකියාව සොයා බැලීම. | |
| (ඇ) | 1999 අංක 33 දරණ ශාක ආරක්ෂණ පනත හා 1981 නොවැම්බර් 02 දිනැති අංක 165/1 දරණ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව ජාතික ශාක නිරෝධායන සේවයේ ආනයන අනුමැතියක් ලබා නොගෙන මෙරටට ආනයනය කර තිබූ මි.ර.ගැ වටිනාකම රු.මිලියන 52 ක් වටිනා ඉඟුරු කිලෝග්‍රෑම් 821,650 ක් නිදහස් කිරිමට රේගු නිලධාරීන් කටයුතු කර තිබුණි.<br>ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ශාක හා ශාකමය කොටස් සම්බන්ධයෙන් ආනයන අනුමැතිය, ලේඛන පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව යන කාර්යයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව හා ශාක නිරෝධායන සේවය අතර පරිගණකගත සම්බන්ධයක් නොතිබීම, පවත්නා නීතිරීති සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් වී නොතිබීම, ආනයනය කල ප්‍රමාණයන් සැසඳීමට ක්‍රමවේදයක් නොමැති වීම සහ කාර්ය පරිපාටි ප්‍රකාරව රේගු නිලධාරීන් තම රාජකාරි ඉටු නොකිරීම ඇතුලු අනෙකුත් අභ්‍යන්තර පාලන දූර්වලතා හේතුවෙන් මෙවැනි අක්‍රමිකතාවයන් සිදු වන බව නිරීක්ෂණය විය. | - ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ශාක හා ශාකමය කොටස් සම්බන්ධයෙන් ආනයන අනුමැතිය, ලේඛන පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව යන කාර්යයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව හා ශාක නිරෝධායන සේවය අතර පරිගණකගත සම්බන්ධයක් පවත්වා ගත යුතුවීම.<br>- පවත්නා නීතිරීති සම්බන්ධයෙන් රේගු නිලධාරීන්ට ප්‍රමාණවත් දැනුමක් ලබාදිය යුතුවීම.<br>- ආනයනය කල ප්‍රමාණයන් සැසඳීමට ක්‍රමවේදයක් සැකසීම සහ කාර්ය පරිපාටි ප්‍රකාරව රේගු නිලධාරීන් තම රාජකාරි ඉටු නොකිරීම ඇතුලු අනෙකුත් අභ්‍යන්තර පාලන දූර්වලතා හේතුවෙන් සිදුවන මෙවැනි අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඈ) | රේගු ආඥා පනතේ 103 වගන්තිය, 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් පත්‍රය හා | පනතේ 103 වගන්තිය හා 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් | තැන්පතු ලෙස නෞකා නියෝජිත ආයතනය ලබා ගන්නා රු.100,000 ක මුදල් |

| | | | |
|---|---|---|---|
| | 2002 දෙසැම්බර් 31 දිනැති අංක 218 (F) දරන අභ්‍යන්තර චක්‍රලේඛය යනාදිය ප්‍රකාරව කොළඹ වරායට පැමිණෙන නෞකා සඳහා රේගු නිලධාරීන් ඉටු කරනු ලබන රේගු රාජකාරී සඳහා වූ අතිකාල ගාස්තුව එම නෞකාවල බහාළුම් ප්‍රමාණය මත ගණනය කර රේගු අතිකාල හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලට බැර කරනු ලැබුවද ඒ සඳහා බලපාන නීති රීති හා රෙගුලාසි අනුව තබාගත යුතු වාර්තා හා ක්‍රමවේදය සම්බන්ධයෙන් අඩුපාඩු ගණනක් පවතින බව නිරීක්ෂණය විය. | පත්‍රය හා 2002 දෙසැම්බර් 31 දිනැති අංක 218 (F) චක්‍රලේඛය ප්‍රකාරව ලබා දී ඇති උපදෙස් හා ක්‍රමවේද අනුගමනය කළ යුතු බව. | සම්බන්ධයෙන් අදාල ගැසට් නිවේදනයේ අවශ්‍ය සංශෝධන සිදු කරන බව.නෞකා නියෝජිත ආයතනවලින් අතිකාල අයකර ගැනීම පරිගණක ගත වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කරන බව<br>අංක **DOPL 218 F** දරන සහ දෙ. නියෝග අනුව හා විගණන නිරීක්ෂණවලින් පෙන්වා දී ඇති කරුණු අනුව එම ගැටළු අවම වන පරිදි නිවාරණ අංශයෙන් ඉවත්ව ඉදිරි පියවර වරාය පාලන ඒකකය වෙත පැවරෙන අතර නැව් ලේඛන දෛනිකව රේ.වා.පා ඒකකය වෙත යැවීම නිසියාකාරව සිදු කිරීම අධීක්ෂණය කිරීම සිදු කරන බව. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිති සහතිකය ලබාදීම ප්‍රමාදවන ආනයනික භාණ්ඩ සඳහා පෞද්ගලික ඇපකර මත එම භාණ්ඩ තාවකාලිකව ආනයනකරුවන්ගේ ගබඩා වෙත නිදහස් කිරීමට අවස්ථාව ලබා දී තිබුණද ප්‍රමිති සහතික ලැබීමට පෙර එම භාණ්ඩ දේශීය වෙළඳපලට නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. තවද ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවන බව පසුගිය විගණන විමසුම් හා වාර්තා මඟින් අනාවරණය කර තිබුණද එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කර නොතිබුණි. 2017 වර්ෂයේදී ද මෙවැනිම සිදුවීමක් නිරීක්ෂණය වූ අතර එහිදී ආනයනකරුවෙකු විසින් ආනයනය කර තිබූ රු.702,084 ක් වටිනා Cut Egde Salad Bowl ඒකක 913 ක් ප්‍රමිත සහතික ලබා ගැනීමට පෙර දේශීය | - ආනයන අපනයන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සක්‍රීය දායකත්වයක් රේගු නිලධාරීන් විසින් ලබාදිය යුතුවීම.<br>- ප්‍රමිති සහතික ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව ඍජුව මැදිහත් විය යුතුවීම.<br>- වරායෙන් නිදහස් කරන භාණ්ඩ සඳහා ප්‍රමිත සහතික ලැබෙන තෙක් රේගු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පවත්වා ගැනීම.<br>- ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීම.<br>- ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපලට නිදහස්කර ඇති පාර්ශව සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීම. | මෙම සිද්ධියට අදාල රේගු විමර්ශනය **(ENSP/CPU/044/2017/ CCR-2466)** ශ්‍රී ලංකා රේගුවේ පාරිභෝගික ආරක්ෂණ අංශය විසින් සිදු කරනු ලබයි. ආනයනය කර තිබූ මෙම භාණ්ඩවල ප්‍රමිතිය තහවුරු වන තෙක් දේශීය වෙළඳපලට නිදහස් නොකරන බවට ආනයනකරු වගකීමට බැඳෙන පරිදි සමාගමේ ඇපයක් **GL II/CG/261** අංකය යටතේ ලියාපදිංචි කර ඇත.<br>කාර්යාල චක්‍රලේඛ අංක 439 අදාල වන්නේ රේගු බදු මුදල් යම් හේතු මත පසුව අයකර ගැනීමට අවශ්‍ය වුවහොත් අයකර ගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් ආනයනකරුගෙන් ලබාගන්නා පුද්ගල ඇපකර සඳහා වේ. මෙම භාණ්ඩ |

වෙළඳපලට නිකුත් කර තිබුණ ද එම භාණ්ඩ ප්‍රමිතියට අනුකූල නොවන බව ප්‍රමිත ආයතනය විසින් තහවුරු කර තිබුණි.

මුදාහැර ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්දේශ මත වන බැවින් ඉහත චක්‍රලේඛය ප්‍රස්තුත කරුණ හා නොගැලපෙන බව නිරීක්ෂණය කරමි. ප්‍රමිතියකින් තොර භාණ්ඩ ශ්‍රී ලංකාවේ වෙළඳපලට පැමිණීම හා එම භාණ්ඩ මගින් පාරිභෝගිකයාට සිදුවන අහිතකර බලපෑම පිළිබඳ මනා අවබෝධයක් රේගු දෙපාර්තමේන්තුවේ පාරිභෝගික ආරක්ෂණ අංශයට ඇති අතර මේ ආකාරයේ වැරදි සම්බන්ධයෙන් දණ්ඩන මුදල් පැනවීම පමණක් ප්‍රමාණවත් නොවන බව අවබෝධ කරගෙන ඇත. එබැවින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික කටයුතු අධිකාරිය, සෞඛ්‍යය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ඒ සම්බන්ධව ගත හැකි පියවර පිළිබඳව දැනටමත් සාකච්ඡා කරමින් පවතී.

(ඊ) ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවන්හිදී නිලධාරීන්ගේ පැමිණීම පිටවීම පිළිබඳව ප්‍රමාණවත් අධීක්ෂණයක් නොවීම, පැමිණීමේ ලේඛන, නිවාඩු ලේඛන අතිකාල ලේඛන ආදීය නිසි පරිදි නඩත්තු නොකිරීම. නිලධාරීන් විදේශගතව සිටි කාලයන්ට අදාලව අතිකාල දීමනා ගෙවා තිබීම, රේගුවේ විවිධ අංශ විවෘත කිරීම සඳහා යතුරු භාර නොගෙන තිබූ නිවාඩු දිනයන් සඳහා ද අතිකාල දීමනා ගෙවා තිබීම වැනි අභ්‍යන්තර පාලන දුර්වලතා බොහොමයක්

- මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කිරීම.
- සේවක කළමනාකරණය හා සම්බන්ධව පවතින සතුටුදායක නොවුණු අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම.

රේගු දෙපාර්තමේන්තුව තුල අතිකාල ගෙවීම් නැවත සමාලෝචනය කර අතිකාල ගෙවීමේ නව ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු වී ඇත.

විගණන විමසුමේ සඳහන් විදේශ පුහුණු වැඩ සටහන් (රාජකාරි) සඳහා සහභාගී වී ඇති නිලධාරීන් විදේශ ගත කාල සීමාවන් තුල අතිකාල සේවයේ යෙදී ඇති බවට අදාල අතිකාල අත්සන් ලේඛන එවා තිබූ අධ්‍යක්ෂ වරුන්ගෙන් මේ වන විට කරුණු විමසා ඇති අතර,

| | | |
|---|---|---|
| නිරීක්ෂණය විය. බොහෝ නිලධාරීන් දින 365 ම සේවයට වාර්තා කර තිබීම හා පැය 24 අතිකාල සේවයේ යෙදීම, වැනි අසාමාන්‍ය තත්ත්වයන් ද නිරීක්ෂණය විය.<br><br>එවැනි තත්ත්වයන් තුල 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2313 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.1,466,843,695 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.830,750,547 ක්ද වශයෙන් වූ එකතුව රු.2,297,594,242 ක් වූ වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ප්‍රධාන සාක්ෂිය වන සේවයට වාර්තා කල බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | | විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිළධාරීන්ගෙන් එම කාල සීමාවන් සඳහා ගෙවා ඇති අතිකාල දීමනා වහාම ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාල ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තිය සහ අදාල පනතට අනුකූලව කටයුතු කිරීමට ආයතනය විසින් කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |